**පොල් වගාකිරීමේ මණ්ඩලය - 2013**

**-------------------------------------**

පොල් වගාකිරීමේ මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 43 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට පොල් වගාකිරීමේ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ලැබිය යුතු ගිණුම්**

ජීප් රථයක් අලුත්වැඩියා කිරීම සඳහා සංස්ථාවකට රු.149,640 ක් 2005 වර්ෂයේදී අත්තිකාරම් වශයෙන් ලබා දී තිබූ නමුත් එම සංස්ථාව වෙතින් අදාළ ජීප් රථයේ අලුත්වැඩියාව සිදුකරගෙන නොතිබුණි. කෙසේ නමුත් ලබා දී තිබූ අත්තිකාරම් ආපසු අයකර ගැනීමකින් තොරව අත්තිකාරම් ගිණුමේ තවදුරටත් පෙන්වා තිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.71,772,762 ක අතිරික්තයක් වූ අතර, එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,207,368 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.73,980,130 ක වර්ධනයට සෙස් ප්‍රදානය රු.මිලියන 174 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

(අ) සමාලෝචිත වර්ෂයේ ආදර්ශ පොල් උයන්වල මෙහෙයුම් ප්‍රතිඵලය රු.71,337,032 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඒ හා සසඳනවිට ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.124,352,387 ක් විය. ඒ අනුව ලාභයේ අඩුවීම රු.53,015,355 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ තවාන් ඒකකයේ රු.91,244,893 ක ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.67,863,491 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ පොහොර ඒකකයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.161,699 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.1,236,868 ක් විය. ඉකුත් වර්ෂයට වඩා පොහොර අලෙවි ආදායම රු.මිලියන 1 කින් අඩුවීම මෙයට හේතු වී තිබුණි.

**3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

(අ) බාහිර පුද්ගලයන් 07 දෙනෙකු විසින් එකතුව රු.13,664,405 ක වන්දි ඉල්ලා මණ්ඩලයට එරෙහිව අධිකරණවල නඩු 08 ක් පවරා තිබුණි.

(ආ) මණ්ඩලය විසින් බාහිර ආයතන හා පුද්ගලයන් 04 දෙනෙකුට එරෙහිව එකතුව රු.2,807,891 ක වන්දි ඉල්ලා අධිකරණවල නඩු 04 ක් පවරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

ව්‍යාප්ති හා සංවර්ධන අංශය, ආදර්ශ පොල් උයන් හා තවාන් සංවර්ධන අංශය, සැලසුම් අංශය, පරිපාලන හා මානව සම්පත් කළමනාකරණ අංශය සහ මූල්‍ය කළමනාකරණ අංශය යනුවෙන් පොල් වගා කිරීමේ මණ්ඩලය අංශ 05 කින් සමන්විත වේ.

සමාලෝචිත වර්ෂය තුළ එක් එක් කාර්යයන්ගේ ඉලක්ක සහ සපුරා ගැනීම් සාරාංශ කර පහත දැක්වේ.

#### (අ) සහනාධාර ගෙවීම්

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී සහනාධාර වැඩසටහන් කිහිපයක් ක්‍රියාත්මක කර තිබූ අතර, වර්ෂය අවසානයේදී සහනාධාර වැඩ සටහන් වල භෞතික ඉලක්කය හා ප්‍රගතිය පහත පරිදි විය.

(i) සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබූ සහනාධාර වැඩසටහන් අතුරෙන් නාගරික ගෙවතු වගා වැඩසටහන හා කප්රුකයි පරපුරයි වැඩසටහන යන සහනාධාර වැඩසටහන් දෙක වර්ෂයේ අවසාන කාර්තු දෙක තුළදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර, එම වැඩසටහන් දෙකට අදාලව පොල් පැල බෙදා දීමේ ප්‍රගතිය අවම මට්ටමක පැවතුණි. එහි භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 20 හා සියයට 6 ක් විය.

(ii) පවතින පොල් ඉඩම් වලින් වැඩි නිෂ්පාදනයක් ලබාගැනීම, පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීමේ අරමුණ වූ අතර ඒ වෙනුවෙන් පාංශු ඛාදනය අඩු කිරීම, තෙතමන සංරක්ෂණය කිරීම, පාළු සිටුවීම වැනි කෘෂි විද්‍යාත්මක කටයුතු කළයුතු වුවද සමාලෝචිත වර්ෂයේදී පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් පාළු සිටුවීම සඳහා පොල් පැල බෙදාදීම පමණක් සිදුකර තිබුණි. මෙසේ පොල් පැල ලබාදීම තුළින් පමණක් පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම ප්‍රමාණවත් නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂයේදී ගවගාල් 250 කට සහනාධාර ලබාදීම සඳහා ඉලක්ක කර තිබුණත් සහනාධාර ලබා දී තිබුණේ ගවගාල් 128 කට පමණක් වීම නිසා එහි භෞතික ප්‍රගතිය සියයට 51 ක් විය.

(iv) සමාලෝචිත වර්ෂයේදී පොල් ඉඩම්වල නල ජල පද්ධති ඉදිකිරීමේ වැඩසටහන යටතේ අක්කර 1000 ක් වෙනුවෙන් සහනාධාර ලබාදීමට ඉලක්ක කර තිබුණත් සහනාධාර ලබා දී තිබුණේ අක්කර 510 කට පමණක් වීම නිසා එහි භෞතික ප්‍රගතිය සියයට 51 ක් විය.

#### (ආ) ආදර්ශ පොල් උයන්

සමාලෝචිත වර්ෂයේදී ආදර්ශ පොල් උයන් ලෙස වතු 12 ක් මණ්ඩලය විසින් කළමනාකරණය කර තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේ මුළු පොල් ඵලදාව ගෙඩි මිලියන 4.59 ක් විය. එය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සියයට 38 ක පසුබෑමකි. මෙයට හේතුව ලෙස "වියළි

අතරමැදි කලාපයේ පිහිටා ඇති ආදර්ශ පොල් උයන්වල අස්වනු අඩුවීමට ප්‍රධාන හේතුව අධික උෂ්ණත්වය හා දැඩි නියං සහිත කාලගුණ තත්ත්වය බව " සභාපතිවරයා දක්වා තිබුණි.

(ii) සාමාන්‍ය තත්ත්වයන් යටතේ පොල් වගා බිම් අක්කරයකින් වාර්ෂිකව අවම වශයෙන් පොල් ගෙඩි 4,500-5,000 ත් අතර ප්‍රමාණයකින් පොල් ඵලදාවක් ලබා ගතහැකි වුවත් සමස්ථයක් ලෙස මණ්ඩලය සතු ආදර්ශ පොල් උයන් වලින් මහයාය පොල් උයන හැර අනෙකුත් සියළුම ආදර්ශ උයන්වල ඵලදාව එම සාමාන්‍ය මට්ටමවත් ළඟා කර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(iii) ආදර්ශ පොල් උයන් ලෙස නඩත්තු කරන පොල් වතු 12 න් පොල් උයන් 04 ක් හැර අනෙකුත් පොල් වතු වල ගසක වාර්ෂික සාමාන්‍ය අස්වැන්න ගෙඩි 50 කට වඩා අඩු අගයන් ගෙන තිබුණි.

(iv) ආදර්ශ පොල් උයන් 08 ක වැටුණු පොල් ප්‍රතිශතය සියයට 30 සිට සියයට 41 දක්වා පරාසයක විය.

(v) සමස්ථයක් ලෙස ආදර්ශ පොල් උයන්හි ඇස්තමේන්තුගත පොල් ඵලදාව ගෙඩි මිලියන 6.57 ක් විය යුතුව තිබූ නමුත් සත්‍ය පොල් ඵලදාව ගෙඩි මිලියන 4.59 ක් වී තිබුණි. ඒ අනුව විචලනය ගෙඩි මිලියන 1.97 ක් එනම් සියයට 30 ක් විය. මෙසේ ආදර්ශ පොල් උයන්හි ඇස්තමේන්තුගත හා සත්‍ය පොල් ඵලදාව අතර ඉහළ විචලනයක් පැවතීමෙන් පොල් ඵලදා සම්බන්ධයෙන් ඇස්තමේන්තු සකස් කිරීම නිසි පරිදි සිදුවී නොතිබුණු බව නිරීක්ෂණය කරනු ලැබේ.

**(ඈ) වතු කළමනාකරණය**

**------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වතුවල ප්‍රගතිය විමර්ශනය කිරීම සඳහා වූ ජාලගත තොරතුරු පද්ධතියට දත්ත ඇතුළත් කිරීමේදී වතු කළමනාකරුගේ මුර පදය භාවිතා කරමින් වතු කළමනාකරු හෝ ඔහුගේ යටත් නිලධාරීන් විසින් අදාළ දත්ත පද්ධතියට ඇතුළත් කර තිබූ අතර, එහිදී ජාලයට ප්‍රවේශවීම සටහන් කරන ලේඛනයක් පවත්වා නොගැනීම හා මෙම දත්ත වෙනමම සටහන් කර තබාගැනීමේ ක්‍රමවේදයක් නොතිබීම නිසා තොරතුරු වල විශ්වාසදායී බව හා එහි වගකීම පැවරීම සම්බන්ධයෙන් ගැටලු ඇතිවිය හැකිව තිබුණි.

(ii) ආදර්ශ පොල් උයන්හි භූමිය ක්ෂේත්‍ර වලට වෙන්කර එසේ වෙන්කරන ලද කොටස එක් එක් ක්ෂේත්‍ර නිලධාරීන්ට පවරා තිබුණි. ඒ අනුව නිලධාරීන් දෛනිකව එම කොටස තුළ සිදුකරනු ලබන කාර්යයන් ක්ෂේත්‍ර පොතෙහි සටහන් කළයුතු අතර, එය වතු කළමනාකරුගේ අධීක්ෂණයට යොමුවිය යුතුය. කෙසේ නමුත් ක්ෂේත්‍ර නිළධාරීන් විසින් දෛනිකව නිසි පරිදි ක්ෂේත්‍ර පොත් නඩත්තු කර නොතිබූ අතර, එය වතු කළමනාකරුගේ අධීක්ෂණයට ලක්වී නොතිබුණි.

**(ඇ) පොල් වගාව සඳහා ඉඩම් යෝග්‍යතා වර්ගීකරණය**

**------------------------------------------------------**

මණ්ඩලය සතු ආදර්ශ පොල් වගාව සඳහා ඉඩම් යෝග්‍යතා වර්ගීකරණයක් සිදුකර නොතිබුණු අතර, මේ නිසා උපරිම ඵලදාවක් ලබාගැනීමට අනුගමනය කළයුතුවන

උපක්‍රමයන් නිවැරදිව හඳුනාගැනීමේ ගැටලුද, පොල් එළදාව නිවැරදිව ඇස්තමේන්තු කිරීමට මගපෙන්වීමක් ලබාගැනීමටද නොහැකිවී තිබුණි.

**(ඉ) ආදර්ශ පොල් උයන්හි මයිටා හානිය පාලනය**

පොල් මයිටා මර්දනය කිරීමේ අන්තර් නිර්දේශයන් හැරුණුවිට තිරසාර ජෛව විද්‍යාත්මක ක්‍රමයක් ලෙස විලෝපිත මයිටාව පොල් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වා දී තිබූ අතර, මණ්ඩලය විලෝපිත මයිටා මධ්‍යස්ථාන 07 ක් පවත්වාගෙන ගොස් තිබුණි. කෙසේ වුවද මණ්ඩලය පවත්වාගෙන යන ආදර්ශ පොල් උයන් 12 හි කලටි/කුරුවල්/කුඩා ගෙඩි ප්‍රමාණයන් ඉහළ යාමට මයිටා හානිය බෙහෙවින් බලපා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

### 4.2.1 අරමුදල් ආයෝජනය

මණ්ඩලය විසින් රු.20,000,000 ක මුදලක් 2011 වර්ෂයේදීත් රු.24,000,000 ක මුදලක් 2012 වර්ෂයේදීත් සත්දින තැන්පතුවල ආයෝජනය කර තිබුණි. 2011 වර්ෂයේ ආයෝජිත රු.20,000,000 ක් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලබාගෙන තිබුණි. මෙසේ රු.මිලියන 44 ක මුදලක් කෙටිකාලීන තැන්පත්වල වසර 02 කට ආසන්න කාලයක් ආයෝජනය කිරීම නිසා දිගුකාලීනව ආයෝජනය කිරීමෙන් ලබාගත හැකිව තිබූ පොළී ආදායමක් මණ්ඩලයට අහිමි වී ගොස් තිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

ත්‍රිකුණාමලය හා පාසිකුඩා නිලධාරී නිල නිවාස ඉදිකළ ආයතන විසින් වැට් බදු සහිත බිල්පත් ඉදිරිපත් කර නොතිබියදී, මණ්ඩලය එම ආයතන වෙත රු.905,031 ක වැට් බදු ද ඇතුළත් කර ගෙවීම් කර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 925 ක් වූ අතර, තථ්‍ය සේවක සංඛ්‍යාව 580 ක් විය. මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා අදාළ වන අනුමත තෘතීයික මට්ටමේ හා ද්විතීයික මට්ටමේ තනතුරු පිළිවෙලින් 10 ක් හා 283 ක්ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 52 ක්ද පුරප්පාඩුව පැවතිණි.

# 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මානව සම්පත් කළමනාකරණය
(ඇ) තවාන් කළමනාකරණය
(ඈ) වතු කළමනාකරණය